# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හා 03 හි විධිවිධාන ප්‍රකාරව විධිමත් ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු වුවද, කෙටිකාලීන පාඨමාලා හා අනෙකුත් මූලාශ්‍ර ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, විශ්වවිද්‍යාලය ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයන්හි කෙටිකාලීන පාඨමාලා ආදායම හා වියදම එකිනෙකට හිලව් කර ඉදිරිපත් කර තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විශ්වවිද්‍යාලයේ කෙටිකාලීන හා අනෙකුත් මූලාශ්‍ර ආදායම් මාර්ගවලින් ලැබෙන ආදායම් සහ ඒ වෙනුවෙන් දරන වියදම් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ගිණුම්ගත කිරීම වෙනුවට විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර කමිටුව වශයෙන් ක්‍රියාත්මක වන උපදේශකත්ව හා බාහිර සම්පත් මධ්‍යස්ථානයේ අනුමැතිය ලද පසු එකී තීරණයන්ට අනුව ගිණුම්ගත කරන බව හෙළදරව් විය. මෙම කමිටු තීරණය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ ලද කෙටිකාලීන පාඨමාලා හා අනෙකුත් මූලාශ්‍ර ආදායම් ලැබීම් හා ඊට අදාල වියදම් 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ආදායම් හා වියදම් ලෙස හඳුනා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වවුනියාව හා ගම්පහ අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටි ඉඩම් වල වටිනාකම රු.585,500 කින් වැඩියෙන් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය ප්‍රාදේශීය කාර්යාල සහ අධ්‍යයන මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිලි ඉදකර ඇති ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලයට නිත්‍යානුකූලව පවරාගෙන නොතිබූ රු.13,792,455 ක වටිනා ඉඩම් හා ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ ඉදිරිපත් කරන ලද තක්සේරු දෙපාර්තමේන්තුවේ අතුරු වාර්තා අනුව ඉඩම් වටිනාකම රු.193,888,000 කින් අඩු විය යුතු බව හා ගොඩනැගිලි වටිනාකම රු.53,905,317 කින් වැඩි විය යුතු බව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින්ද පෙන්වා තිබුණි. තවද වත්කම් ප්‍රත්‍යාගණන කාර්යයන් නිමකර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ වාර්තාව 2013 අප්‍රේල් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, සමුච්චිත ක්ෂය සහ ප්‍රත්‍යාගණන සංචිතය යන ශේෂයන්හි නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ඇ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති ආධාර වශයෙන් 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාල සීමාව තුල රු. මිලියන 1,896.5 ක් වටිනා වාහන, ලීබඩු, යන්ත්‍ර සහ උපකරණ ලැබී තිබූ නමුත් කාර්යාල උපකරණ, යන්ත්‍ර හා පිරියත අගය රු.මිලියන 663.5 ක් අඩුවෙන්ද වාහන, ලී බඩු හා විද්‍යාගාර උපකරණ රු.මිලියන 144 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ලැබුණු භාණ්ඩ ප්‍රමාණයන් හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු නොකිරීමෙන් ස්ථාවර වත්කම් මත වූ ක්ෂය අඩුවෙන් දැක්වෙන බව නිරීක්ෂණය විය.

(ඉ) විශ්වවිද්‍යාලයේ නාවල ප්‍රධාන පරිශ්‍රයේ සහ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල රු. මිලියන 971.9 ක් වටිනා ඉදකිරීම් සිදුකර තිබූ නමුත් එය රු.මිලියන 903.8 ක් ලෙස රු.මිලියන 68.1 ක් අඩුවෙන්ද එයට අදාල සමුච්චිත ක්ෂය රු.මිලියන 12.4 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. ඉදකිරීම් නිමවූ වර්ෂය නිවැරදිව නිශ්චය නොකිරීම සහ ප්‍රාමාණිකෘත හානි වන්දි (Liquidated Damages) සැලකිල්ලට නොගැනීම නිසා සිදු වූ සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.මිලියන 26.9 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ පාඨමාලා ගාස්තු ඇතුළු අනෙකුත් ගාස්තු වෙනුවෙන් සිසුන් විසින් විශ්වවිද්‍යාලයේ රුස්කිරීමේ ගිණුමකට බැර කළ මුදල් දෛනිකව හඳුනාගෙන සටහන් නොකිරීම හේතුවෙන් වර්ෂ කිහිපයක සිට පැවත එන රු.10,284,621ක් වූ සිසුන්ගෙන් ලැබූ මුදල් හඳුනා නොගත් ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) පාලක සභාව විසින් පත්කර ඇති උපදේශකත්ව හා බාහිර සම්පත් මධ්‍යස්ථානය නැමැති කමිටුවේ (CERC) අනුමැතිය යටතේ වන ආදායම් මූලාශ්‍රයන්ගෙන් ලද මුදල් ආදායම අදාල කාර්ය නිමකර ඒ ඒ අවස්ථාවේදී ආදායම හඳුනා නොගෙන වසර කිහිපයකට පසුව ආදායම් හඳුනාගැනීම සිදුකර ගිණුම්ගත කර තිබුණි. 2008 සිට 2012 වර්ෂයන් දක්වා අවස්ථා 08 කදී ආදායම රු.12,691,683 ක් හා ඊට අදාල වියදම වූ රු.6,787,295 ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් විශ්වවිද්‍යාලය ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඌ) විශ්වවිද්‍යාල පනතේ 99(ඇ) වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනයට අයිති වූද, කවර ප්‍රභවයකින් හෝ අත්කරගනු ලැබුවා වූද, වෙනත් සියළු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනා නොගත් කෙටිකාලීන පාඨමාලා හා අනෙකුත් ආදායම් මූලාශ්‍ර 03 ක් වෙනුවෙන් ලද රු.4,966,250 ක් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාවද්‍ය ලෙස අරමුදලක් සේ දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයෙදී විශ්වවිද්‍යාලයේ කාර්යයන් සඳහා නිලධාරීන්ට ලබාදී තිබූ විවිධ අත්තිකාරම් හා සැපයුම් අත්තිකාරම්වලින් නොපියවූ ශේෂය රු.1,156,678 ක් වූ අතර ඉන් රු.159,430 ක් වර්ෂ 03 කට වැඩි ශේෂයන් විය. මෙම අත්තිකාරම් මුදල් අත්තිකාරම් ලබා ගත් නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ආයතනය ගෙන නොතිබුණි.

(ඒ) විවෘත විශ්වවිද්‍යාලයට විදේශ ආධාර ව්‍යාපෘති හා අනෙකුත් විශේෂ ව්‍යාපෘති සඳහා ලද මුදලින් අදාල කාර්යය නිමකර ඉතිරි වූ රු.12,703,904 ක ශේෂයක් ආපසු නොගෙවා 2012 දෙසැම්බර් 31 දිනට සීමාකාරී අරමුදල් ලෙස දක්වා තිබුණි. එම ශේෂය තුළ වසර 05 කට වැඩි කාලයක් රඳවාගෙන තිබූ රු.4,643,856 ක්ද විය.

(ඔ) සීමාකාරී අරමුදල් ශේෂය තුළ විවිධ අරමුදල් සඳහා වෙන්කර තිබූ අරමුදල් මූලාශ්‍ර 44 ක එකතුව වූ රු.19,123,144 ක් 2012 වර්ෂය තුළදී ගනුදෙනු සිදුනොවී තිබූ අතර එකතුව රු.10,572,256 ක් වූ අරමුදල් 21 ක් වසර 03 කට වැඩිකාලයක් අක්‍රියව තිබුණි. තවද එකතුව රු.4,688,565 ක් වූ අරමුදල් 13 ක් වසර 05 කට වැඩි කාලයක් අක්‍රියව තිබුණි.

(ඕ) කෙටිකාලීන පාඨමාලා ආදායම් වශයෙන් සලකා උපාධි හා පශ්චාත් උපාධි මට්ටමේ පාඨමාලා 04 ක් වෙනුවෙන් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ලද ආදායම් රු.17,312,154 ක් හා වියදම් රු.13,702,714 ක් මූල්‍ය ප්‍රකාශනතුළින් ආදායම් හෝ වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි. හඳුනානොගත් පාඨමාලා ගාස්තු ලැබීම් කලින් ලද අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

### 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

2012 වර්ෂයේ ගිවිසුම් කඩ කළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරින්ගෙන් අයකර ගෙන තිබුණු මුදල රු.12,075,117 ක් වුවද, ආයතන අංශයෙන් ඉදිරිපත් කළ උපලේඛනය අනුව නිලධාරින් 16 දෙනෙකුගෙන් අය කර තිබුණු මුදල රු.15,078,188 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.3,003,071 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.5 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය කාර්යාලවල සහ අධ්‍යයන මධ්‍යස්ථාන 20 ක් තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දුරස්ථ අධ්‍යාපන පරිගණක පිවිසුම් මධ්‍යස්ථාන (NODES Access Centers) පවත්වා ගෙන යනු ලබන අතර, එම මධ්‍යස්ථාන සඳහා විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති ගොඩනැගිලි ඉඩපහසුකම්, විදුලිය, ජලය, ආරක්ෂක හා සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.36,993,600 ක් අයකර ගැනීමට ඵලදායීව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලීය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විදේශය ශිෂ්‍යත්ව ලබාදීමේදී ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් හා නිලධාරින් 40 දෙනෙකු සමග එළඹ තිබූ ගිවිසුම් අනුව එකතුව රු.82,622,135 ක් වූ ඇප බැඳුම්කර වටිනාකමින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.11,001,675 ක මුදල අයකර ගැනීම සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග සතුටුදායක තත්ත්වයක නොතිබුණ.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පහත විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී එම ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය/ සත්‍යතාපනය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| (අ) ආධාර වශයෙන් ලද - ලී බඩු | 116,887,429 | වත්කම් නිවැරදිව ලැබුණු බවට සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන හා ලේඛන. |
| (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 376,765,979 | පැමිණීම සටහන් කිරීමේ ලේඛන |

### 1.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීත හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 371 (ආ) | (i) උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම මුදල රු.20,000 ඉක්මවා අවස්ථා 171 දී රු.13,424,081 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ අතර ඉන් අවස්ථා 37 කදී රු.75,000 ක් ඉක්මවා එකතුව රු.7,567,365 ක අත්තිකාරම් ගෙවා තිබුණි.<br><br>(ii) තත්කාර්ය අතුරු අග්‍රිමයන් පිළිගත හැකි ඇස්තමේන්තුවක් මත මුදල් ලබා නොදීම හේතුවෙන් අත්තිකාරම් මුදල් ඉතිරිවීම් සියයට 20 සිට සියයට 94 ක පරාසයක පැවතුණ. |

(ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

(i) III පරිච්ඡේදයේ 26.17 උපවගන්තිය — කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි දින පාසැල්වල (Day School) දේශන සඳහා බාහිර කථිකාචාර්යවරුන්ට ගෙවීම් වලට අදාල ලේඛන නිසිලෙස නඩත්තු කර නොතිබුණි.

(ii) XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය — විශ්වවිද්‍යාල සේවයේ නියුක්ත සෑම තැනැත්තකුම පැමිණීම සහ පිටවීම සටහන් කළයුතු වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි.

(ඇ) 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය — උපදේශකත්ව හා බාහිර සම්පත් මධ්‍යස්ථාන අනුමැතිය යටතේ පවත්වා තිබූ දිගුකාලීන පාඨමාලා 04 ක ආදායම් අතිරික්තය වූ රු.5,519,736 ක් සමාලෝචිත වර්ෂයේදී සාවද්‍ය ලෙස විවිධ අරමුදල් වලට මාරුකර තිබුණි.

(ඈ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය — පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයේ පීඨයන් හා ප්‍රාදේශීය මධ්‍යස්ථානවල කාර්ය සාධනය අනුව දිරිදීමනා යෝජනාවලියක් අනුමත කර 2012 මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.50,067,844 ක ඌනතාවයක් පැවතියදීත් රු.7,986,409 ක් දිරිදීමනා ගෙවීම සඳහා වෙන්කිරීම් කර තිබුණි.

(ඉ) 2011 ඔක්තෝබර් 06 දිනැති අංක වීවී/2011/ වීසී/ 01 දරන විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර චක්‍රලේඛය — අධ්‍යයන මධ්‍යස්ථානවල දුරකථන, විදුලිය, ජලය හා දෛනික සේවකයන්ට ගෙවීම් කිරීම සඳහා ඉතිරි කිරීම් ගිණුම් ආරම්භ කර අත්තිකාරම් මුදලක ලබාදීමට තීරණය කර තිබුණද, අධ්‍යයන මධ්‍යස්ථානවල කාර්යභාරය අනුව මූල්‍යමය අවශ්‍යතාවයන් සැලකිල්ලට නොගෙන මධ්‍යස්ථාන 10 ක් සඳහා රු.50,000 ක් බැගින් රු.500,000 ක් ලබා දී තිබූ අතර ඉන් මධ්‍යස්ථාන 06 ක රු.300,000 ක මුදලක් අක්‍රියව පැවතුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.713,167,844 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිකව ඉකුත් වර්ෂයේ රු.1,068,810,727 ක් අතිරික්තයක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.663,100,000 ක ප්‍රදාන හේතු කොටගෙන එම ඌනතාවය රු.50,067,844 ක් දක්වා අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.628,386,000 ක රජයේ ප්‍රදානයක් හා පසුගිය කාලපරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂය 2011 වර්ෂයට ආදායමක් ලෙස හඳුනාගැනීම හේතුකොට ගෙන එම වර්ෂයේ අතිරික්තය රු.1,697,196,727 දක්වා වර්ධනය වී තිබුණි.

ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,747,264,571 ක පිරිහීම සඳහා ශිෂ්‍ය ආදායම් හා අයදුම්පත් අලෙවි ආදායම් රු.206,309,920 ක අඩුවීමත් පරිත්‍යාග හා ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂය රු.1,592,996,579 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ 2011-2016 වර්ෂ සඳහා පිළියලකළ සංයුක්ත සැලැස්ම අනුව පාඨමාලාවන්හි විභාග ප්‍රතිඵල දින 45 ක් තුළ නිකුත් කළ යුතු වුවද, 2011/2012 වර්ෂවලදී පාඨමාලා 60 කට අදාලව පවත්වන ලද විභාග අවස්ථා 76 කින් අවස්ථා 19 කදී ප්‍රතිඵල නිකුත් කිරීමට දින 180 කට (මාස 06 කට වඩා) වැඩි කාලයක් ගතවී තිබූ අතර ඉන් අවස්ථා 06 කදී ප්‍රතිඵල නිකුත් කිරීමට දින 365 කට (වසරකට) වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. 2011 වර්ෂයේ පවත්වන ලද විභාග අවස්ථා 03 කට අදාල ප්‍රතිඵල 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිකුත් කර නොතිබුණි.

(ආ) විභාග පැවැත්වීම ප්‍රමාදවීම හා ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද කිරීම නිසා ඊළඟ කණ්ඩායම හෝ ඊළඟ අදියර සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමට එහි අධ්‍යයන කටයුතු ඇරඹීමට හා විභාග පැවැත්වීම ප්‍රමාදවීමෙන් ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉලක්කගත කාලවකවානු තුළදී ඉටු කර නොතිබුණි.

## 3.2 කළමනාකරන අකාර්යක්ෂමතා

කළමනාකරන තොරතුරු පද්ධතිය සැකසීම සේවාදායක ආයතන 03 ක් මගින් සිදුකර තිබූ අතර ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු කළමනාකරන තොරතුරු පද්ධතිය විවෘත විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට පවරාගෙන එම දෙපාර්තමේන්තුව මගින් සේවා සැපයීම සිදුකළ යුතු වුවත්, එසේ නොකර ගිණුම් අංශයට අදාලවූ කාර්යයන් වෙනුවෙන් පමණක් පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ රු.මිලියන 2.8 ක් ගෙවා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය මගින් පරිහරණය කරනු ලබන ඉඩම් අතරින් නාවල පරිශ්‍රයට අයත් ඉඩම් ප්‍රමාණය විවිධ ලේඛනවල එනම් ඉඩම් ඔප්පුව, මිනුම් සැලැස්ම, ස්ථාවර වත්කම් ලේඛනය හා පරිපාලන අංශයේ පැවති ඉඩම් ලේඛනයෙහි එකිනෙකට වෙනස් ඉඩම් ප්‍රමාණයන් දක්වා තිබුණි. තවද නාවල පරිශ්‍රයට අයත් ඉඩමෙන් කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය සඳහා 2007 වර්ෂයේදී වන්දි ගෙවා පර්චස් 166.81 ක් අත්පත් කර ගෙන තිබුණද, අදාල වෙනස්වීම් ඇතුලත් කර ඉඩමේ ඔප්පුව හා මිනුම් සැලසුම්ද අනෙකුත් ලේඛනද සංශෝධනය කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන 12 ක් ඉදකර තිබුණත් එම ඉඩම් විශ්වවිද්‍යාලයට පවරාගෙන නොතිබුණි.

(ඇ) බණ්ඩාරවෙල අධ්‍යයන මධ්‍යස්ථානය හා සංචාරක බංගලාව ඉදකර තිබුණ පර්චස් 135.21 ඉඩම, ඉඩම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ලේඛකාධිකාරිට නිකුත් කර තිබූ දූරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියෙන් ලැබුණු රු.257,687 ක් වටිනා ලැප්ටොප් පරිගණකය 2010 ජනවාරි 01 දින අස්ථානගත වී තිබුණි. පරිගණකය නැතිවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXV වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය ප්‍රකාරව දේපළ නැතිවීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුනොකර කපා හැරීමට තීරණය කර තිබුණි.

(ආ) විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ තොරතුරු තාක්ෂණික සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා විවිධ අවස්ථාවල රු.මිලියන 7.5 ක් ලබා දී තිබුණු අතර එය අදාළ කාර්යයට නොයොදා රු. මිලයන 06 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඇ) රජයට අයත් ඉඩම්වල විශ්වවිද්‍යාලය මඟින් ගොඩනැගිලි ඉදිකර පරිහරණය කරනු ලබන අතර එම ඉඩම් පවරා ගැනීමට අදාල කටයුතු කිරීමේ වගකීම විශ්වවිද්‍යාලයේ කළමනාකරණය සතු වුවද, අධ්‍යයන හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටි ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට අනුගමනය කර තිබූ පියවරයන් සතුටුදායක මට්ටමක නොතිබුණි.

## 3.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

දූරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් යටතේ විශ්වවිද්‍යාලයේ ඇසුරුම් අංශය සඳහා 2009 වර්ෂයේ රු.5,308,800 ක් වටිනා කුඩා බන්ඩල් ඇසුරුම් යන්ත්‍ර 03 ක් ලබා දී තිබුණි. මෙම යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී අධික වියදමක් දැරීමට සිදුවීමෙන් සහ සැපයුම්කරු විසින් මොඩියුල 02 ක් සපයා නොතිබූ හෙයින් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි.

මෙම යන්ත්‍ර 03 සම්බන්ධයෙන් රජයේ මුද්‍රණාලයේ නිලධාරීන් කළ පරීක්ෂණ වාර්තාව අනුව මුද්‍රණාලය හා ඇසුරුම් අංශය සඳහා මෙම යන්ත්‍ර අවශ්‍ය නොවන බව තහවුරු කර තිබීම හේතුවෙන් වැය කරන ලද රු.5,308,800 ක් නිශ්කාර්ය පිරිවැයක් බව නිරීක්ෂණය විය.

## 3.6 ආර්ථික නොවූ ගනුදෙනු

විවෘත විශ්වවිද්‍යාලයේ 30 වන සංවත්සර උත්සවය වෙනුවෙන් අලෙවි කිරීම සඳහා 2010 වර්ෂයේ එකක් රු.490 බැගින් ටයපටි 2000 ක් රු.980,000 ක් වැයකර මිලදී ගෙන තිබුණි. මෙම ටයපටිවලින් නොමිලේ නිකුත් කිරීම් 27 ක්ද, 177 අලෙවි කිරීම් ඇතුළුව ටයපටි 204 ක් නිකුත් කර තිබූ අතර ඉතිරිය 1796 ක් විය. ඒ අනුව අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව මිලදී ගැනීම හේතුවෙන් ඒවා අලෙවි කර ගත නොහැකිව ගබඩාවේ තිබුණි.

## 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යයන කාර්යමණ්ඩලය | 346 | 285 | 61 |
| අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය | 188 | 155 | 33 |
| පරිපාලන කාර්යමණ්ඩලය | 87 | 50 | 37 |
| අනධ්‍යයන කාර්යමණ්ඩලය | 633 | 511 | 122 |
| | 1,254 | 1,001 | 253 |

මේ අනුව විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 1,254 ක් වූ අතර ඉන් 253 ක් එනම් සියයට 20 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතරින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියයට 18 ක් ද අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සියයට 18 ක් ද පරිපාලන කාර්ය මණ්ඩලයේ සියයට 43 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියයට 19 ක් ද වශයෙන් ආංශිකව ඉහළ පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

2012 ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉටුකළ යුතු බවට කාර්යන් 231 ක් නියම කර තිබුණද, එම කාර්යන්හි ප්‍රගතිය සම්බන්ධව තොරතුරු විගණනය වෙත වාර්තා නොකෙරුණි. තවද විශ්වවිද්‍යාලය 2012 වර්ෂය සඳහා වන කාර්යසාධන වාර්තා පිළියෙලකර නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකළ යුතු බවට දක්වා තිබූ කාර්යයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවට අනුව කාර්යයන් 21 ක් ඉටුකිරීම ප්‍රමාද කර තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුව විවෘත විශ්වවිද්‍යාලයට අදාලව විෂයයන් 12ක් යටතේ අභ්‍යන්තර විගණන වැඩසටහන සැලසුම් කළද එක් විෂයක් වූ ප්‍රදේශීය මධ්‍යස්ථානවල විගණන කාර්යයන් කාර්ය මණ්ඩල නොමැතිවීමෙන් ආවරණය කර නොතිබුණි.

(ආ) ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තනතුරු සංඛ්‍යාවක් අනුමත කර ගැනීම හා බඳවා ගැනම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

2012 වර්ෂයේ ආදායම් මූලාශ්‍ර 07 ක් සඳහා ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර සියයට 33 සිට සියයට 1238 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. තවද වියදම් ශීර්ෂ 19 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 25 සිට සියයට 202 දක්වා විචලනයක් විය. අදාල වියදම් සැලකිල්ලට ගැනීමේදී අයවැය ලේඛනගත තොරතුරු හා සත්‍ය ආදායම වියදම සැසඳීමේදී විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

(ආ) අරමුදල් පාලනය.

(ඇ) මුදල් හා බැංකු කටයුතු

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

(ඉ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම